# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,923/6 — 1970 සැප්තැම්බර් 18 වැනි සිකුරාදා — 1970.9.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

## පළාත් පාලන නිවේදන

එල්. ජී.—ජී. 29/70 — එල්පීඩී/බීසී/3/6/3

### නගර සභා ආඥාපනත

### 184 වැනි වගන්තිය යටතේ ආඥාව

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 184 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ වැඩ බලන ඇමති විලියම් නීල් ද අල්විස් වන මම, වත්තේගම නගර සභාවේ සභාපති වාකවට වික්‍රමසිංහලාගේ දොන් ධර්මසිරි මහතා සම්බන්ධයෙන්—

(අ) එකී ආඥාපනතින් පැවරී ඇති රාජකාරි කටයුතු ඉටු කිරීම ඔනෑකමින් පැහැර හැරීම හෝ එම රාජකාරි කටයුතු ඉටු කිරීමෙහිලා විෂමාචාරයෙන් කටයුතු කිරීම,

(ආ) අදක්ෂතාවය සහ අයථා පාලනය, හා

(ඇ) එකී ආඥාපනතින් පැවරී ඇති බලතල අයථා අත්දමින් පරිහරණය කිරීම,

යන මේවා ඔප්පු වන ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බවට මා සෑහීමට පත්ව සිටින බැවින් මෙ ආඥාවෙන් එකී වාකවට වික්‍රමසිංහලාගේ දොන් ධර්මසිරි මහතා එකී නගර සභාවේ සභාපති ධුරයෙන් ඉවත් කරමි.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ
වැඩබලන ඇමති.

1970 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

9—1022


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

640/3——ජේ 16908—5,500 (70/9)